# නූතන සිංහල සමාජයේ කුලය

ප්‍රසන්න ද සොයිසා

## සාම්ප්‍රදායික මතය

සෙලෙස්ටින් බෝග්ලේ කුල ප්‍රජා සඳහා 'විවාහය සහ ආශ්‍රය, ශ්‍රම විභජනය සහ ධූරාවලිය යන කාරණාවල දී වෙන් කිරීම මගින් එකිනෙක හා වෙනස් කරන ලද සහ එකිනෙකට සම්බන්ධ කරන ලද පරම්පරාගත කණ්ඩායම්' යන නිර්වචනය ලබා දී ඇත (ඩුමන්ට් 1999: 21). බෝග්ලේ විසින් පළ කරන ලද *Essays on the Caste System* කෘතියෙහි කුල ක්‍රමයෙහි පදනම් තුනක් ගැන සඳහන් වේ: (1) රැකියාවේ පාරම්පරික සුවිශේෂීකරණය (2) ධූරාවලිය (3) එක් කණ්ඩායමක් අනෙක් කණ්ඩායමෙන් දුරස්ථභාවයක් පවත්වා ගැනීම (ශර්මා 2005: 13).

ජී. එස්. ඝූර්යේ කුල ක්‍රමයක ලක්ෂණ හයක් ඉදිරිපත් කරයි. ඒවා නම්: (1) සමාජය කොටස්වලට බෙදා වෙන් කිරීම (2) ධූරාවලිය (3) ආහාර ගැනීම සහ සමාජ සම්බන්ධතා සඳහා සීමා පැනවීම (4) ඇතැම් කොටස්වල සිවිල් සහ ආගමික අශක්නුතා සහ ඇතැම් කොටස් සතු වරප්‍රසාද (5) නිදහසේ රැකියාවක් තෝරා ගැනීමට අවකාශයක් නැති බව (6) විවාහයට ඇති සීමා (ඝූර්යේ 2008: 39-54).

හටන් කුලය දකින්නේ මිණුම්දඬු හතකිනි: (1) අන්තර්ජන්‍ය (කුලය තුළ සිදු වන) විවාහය (2) වෙනස් කුල අතර සහභෝජනය (එක්ව ආහාර ගැනීම) පිළිබඳ සීමා (3) ධූරාවලිය (4) පහළ කුලයක අයෙකු සමග සහභෝජිත්වය (එකට ආහාර ගැනීම), ලිංගික සම්බන්ධතා පැවැත්වීම, වතාවත්වලට සහභාගි වීම නිසා ඉහළ කුලයක අයෙකු අපවිත්‍ර වීම (5) කුලයකට අයත් සාම්ප්‍රදායික රැකියාවක් පැවතීම (6) තත්වය උපතින් තීරණය වීම (7) සමස්ත පද්ධතිය බ්‍රාහ්මණයන්ට ලබා දෙන නම්බුව වටා යොමු වීම (ලීච් 1979: 2-3).

කුලය පිළිබඳ මෙම අදහස් පසුබිමේ තබා ගෙන ලාංකේය කුලයේ විවිධ පැති පිළිබඳව අපගේ සාකච්ඡාව කරා යොමු වෙමු.

## කුලය සහ කුල ක්‍රමය

කුලය මෙරට තුළ බිහි වී වර්ධනය වූවක් නොව අනෙකුත් බොහෝ සමාජීය සහ සංස්කෘතික අංග මෙන් ඉන්දියානු සම්භවයක් ඇත්තකි (රයන් 2004ඃ 5). එහෙත් මෙහි දී අප මතක තබා ගත යුත්තක් ද ඇත. එනම්, එය ලංකාවේ මුල් බැස ගත්තේ ඉන්දියානු කුල ක්‍රමයට වඩා වෙනස් ආකාරයකින් බවයි. මෙය ලාංකේය සන්දර්භය තුළ කුලයෙහි සුවිශේෂී තත්වයකි. බ්‍රයිස් රයන් මෙය මෙසේ දක්වා ඇතඃ 'සිංහල කුල ව්‍යුහය තේරුම් ගැනිමේ දී වැදගත්ම සාධකය වන්නේ, පොදුවේ සලකනු ලබන ආකාරයෙන්, සිංහලයන් බුද්ධාගම ආරක්ෂා කර ගැනීම නොව සිංහලයන් බ්‍රාහ්මණයන් ආරක්ෂා කර නොගැනීමයි' (රයන් 2004ඃ 8). මෙම හේතුව නිසා සිංහල සමාජයේ කුලය යටත් පිරිසෙයින් මහනුවර යුගය වන විට වත්, බොහෝ සෙයින් නිරාගමික වී තිබුණ බව පැහැදිලිය. මේ ගැන රැල්ෆ් පීරිස් මෙසේ දක්වයිඃ 'ඓහික වීමට (ලෞකික වීමට) තුඩු දුන් කරුණු කුලය රඳා පැවති යාජක පදනම මුලිනුපුටා දැමීමට තරම් සමත් වුව ද ශක්තිමත් මධ්‍යම ආණ්ඩුවක පාලන තන්ත්‍රය මඟින් කුලය නමැති සංස්ථාව ඒකාබද්ධ කරන ලද අතර ම එයට එක්තරා නීත්‍යානුකූල මුහුණුවරක් ද දෙන ලදි' (පීරිස් 2001ඃ 193). 'මේ අයුරින්, කුලය ඓහික කරන ලදුව එහි යාජක (ආගමික) පදනමෙන් මුලිනුපුටා දමනා ලද්දේ වී නමුදු තදනන්තර ව රජය විසින් එයට නීත්‍යානුකූල මුහුණුවරක් දී එය තිරිහන් බවට ද පමුණුවන ලදි' (පීරිස් 2001ඃ 193).

## විකාශන ක්‍රියාවලිය

සාමාන්‍ය ස්වාභාවික සමාජ සංවර්ධන මාවතක් ඔස්සේ ගමන් නොකිරීම හේතු කොට ගෙන ලාංකේය කුලයේ විවිධ සංකීර්ණතා දැක ගත හැක.

පූර්ව යටත් විජිත කුල ක්‍රමය නැතහොත් කුල වැඩවසම් ක්‍රමය කෙරෙහි ධනේශ්වර ක්‍රමයේ බලපෑම වැදගත් සංසිද්ධියකි. එබැවින්, කුල ක්‍රමයේ පරිණාමය පිළිබඳ සාකච්ඡාවේ දී ලංකාවේ පැවති ධනේශ්වර ක්‍රමය සහ ධනපති පංතියේ ස්වභාවය ඍජුවම අදාළ වේ. කාර්මික ප්‍රාග්ධනයක් සහ ස්වාධීන ධනපති පංතියක් නොමැති වීමේ සුවිශේෂී තත්වය නිසාම ලාංකික ධනේශ්වර ක්‍රමය කාර්මික ධනේශ්වර සමාජවල පැවති ධනේශ්වර ක්‍රමයෙන් වෙනස් වන බව ජයවර්ධන (2007) සහ බණ්ඩාරගේ (1985) පෙන්වා දෙති.

එකී ධනේශ්වර ක්‍රමයේ සහ ධනපති පංතියේ සුවිශේෂී ස්වභාවය නිසාම වැඩවසම් ක්‍රමය අහෝසි වී නොගිය අතර එයට පූර්ව ධනේශ්වර ක්‍රමයේ පැවති ආකාරයෙන් පැවතීමට සහ විකාශනය වීමට ඉඩක් ලැබුණේ ද නැත.

නිව්ටන් ගුණසිංහ කුලය පිළිබඳ විශ්ලේෂණයක යෙදෙමින් ප්‍රකාශ කරන්නේ ලංකාවේ සංවර්ධන ක්‍රියාවලිය කෙරෙහි යටත් විජිත පාලකයන්ගේ මැදිහත් වීමක් සිදු නොවූයේ නම් 'මෙම පෞරාණික සම්බන්ධතා ස්වාභාවික මරණයකට පත් විය හැකිව තිබුණ බවයි' (ගුණසිංහ 1990: 198). යටත් විජිත මැදිහත් වීම ලංකාවේ බොහෝ සමාජ සංස්කෘතික ආයතනවලට කරන ලද සුවිශාල වෙනස්කම් අතර කුලයට සහ කුල ක්‍රමයට කරන ලද වෙනස්කම් ද ප්‍රධාන තැනක් ගනී. මෙම යටත් විජිත මැදිහත් වීම කුමාරි ජයවර්ධන සූත්‍රගත කොට දක්වන්නේ මෙසේය: 'යටත් විජිතවාදයේ සහ ධනවාදයේ නැගීම සමග වැඩවසම් ක්‍රමය අහෝසි නොවුණ අතර එහි බොහෝ ක්‍රියා මාර්ග නිරතුරුව සක්‍රීය කිරීම, උපයෝගි කර ගැනීම සහ ශක්තිමත් කිරීම යටත් විජිත පාලකයන් සහ දේශීය ධනපතියන් විසින් කරනු ලැබීය' (ජයවර්ධන 2007: 358).

කුලයේ විකාශන ක්‍රියාවලිය අවධි තුනක් ඔස්සේ සලකා බැලිය හැක. පූර්ව යටත් විජිත කුල ක්‍රමය, යටත් විජිත කුල ක්‍රමය සහ පශ්චාද් යටත් විජිත කුල ක්‍රමය යනුවෙනි. මෙකී එක් එක් අවධිය පිළිබඳව ඉදිරියේ දී සාකච්ඡාවට භාජනය කෙරේ.

## සිංහල සමාජයේ කුලය

පූර්ව යටත් විජිත සිංහල කුලයේ ස්වභාවය පිළිබඳව විමසීමකට මුලින්ම යොමු වෙමු. රැල්ෆ් පීරිස්ගේ **සිංහල සමාජ සංවිධානය - මහනුවර යුගය** කෘතිය ඒ සඳහා ප්‍රයෝජනවත්ය. මෙම කෘතිය මහනුවර යුගයේ උඩරට රාජධානියට සීමා වී ඇත. එසේ වුවත්, පහතරටට විශේෂිත වූ ඇතැම් කුල උඩරට සුලභව දක්නට නොලැබීම වැනි තත්වයක් පැවතියත්, පූර්ව යටත් විජිත සිංහල කුලයේ සාමාන්‍ය ස්වභාවය පිළිබඳව එමගින් පැහැදිලි අදහසක් ඇති කර ගත හැකිය.

'කුලය ඉපැරණි කාලයේ දී නියම කරන ලද, වෙනස් කළ නොහැකි ඉරණමකැයි යන විශ්වාසය නිසා තමනට වඩා උසස් කුලිකයන්ට මෙහෙවර කිරීම, තමන් වෙත පැවරී ඇති යුතුකමක් සේ හීන කුලිකයෝ නිහඬ ව පිළිගත් හ' (පීරිස් 2001: 185). කුලය මත පදනම් වූ ධූරාලියක් ස්ථාපනය වී පැවති බව මෙයින් පැහැදිලි ය. තමනට වඩා උසස් කුලවල අයට තමනට වඩා උසස් කුලවල අයගෙන් සේවය ලබා ගැනීමේ තත්වයක් පැවති බම ද ඔහු දක්වයි (පීරිස් 2001: 188).

කුලය මගින් මනුෂ්‍ය චර්යාව මත පනවන ලද සීමා පූර්ව යටත් විජිත කුල ක්‍රමය තුළ දක්නට ලැබූ ආකාරය පීරිස් මෙසේ විස්තර කරයි: 'කුල දෙකක් අතර වූ සම්බන්ධතාව සිරිත් විරිත් සහ සමාජ වහර අනුව තීරණය වුණ අතර, විවිධ කුල අතර දක්නට තිබුණු සමාජ පරතරය බෙහෙවින් වෙනස් විය... හීන කුලික ඉඩම් හිමියාගේ නිවසෙහි දී කිසි ම විටෙක ඔවුහු ආහාර අනුභව නො කළහ. ඇඳුම් පැළඳුම් ද සකස් වූයේ කුලය අනුව ය' (පීරිස් 2001: 190). 'සිය කුලයෙන් බැහැරව හිර ගනුදෙනු කිරීම සම්පූර්ණයෙන් ම තහනම් ය. වෙනත් වචනවලින් කිව හොත්, කුලය අන්තර්ජන්‍ය විවාහයෙන් සම්ප්‍රයුක්ත ය' (පීරිස් 2001: 191).

මේ අනුව පැහැදිලි වන කරුණ නම් පූර්ව යටත් විජිත යුගයේ ලංකාවේ පැවති කුලයේ ස්වභාවය කුලය පිළිබඳ මුලින් සඳහන් කරන ලද සම්භාව්‍ය/සාම්ප්‍රදායික අදහස්/නිර්වචන සමග හොඳින් ගැළපෙන බවයි. එහෙත් පශ්චාද් යටත් විජිත කුලය සඳහා ඉහත කී අදහස්/නිර්වචන ඒ අයුරින්ම අදාළ නොවේ. (එය ඉදිරියේ දී සාකච්ඡාවට භාජනය කෙරේ).

යටත් විජිත සමය තුළ දී කුලය යන ප්‍රපංචය යම් වෙනසකට භාජනය වී ඇත. එය කවර ආකාරයේ වෙනසක් දැයි විමසා බලමු.

ධනේශ්වර ක්‍රමය, යටත් විජිත පාලකයන් විසින් ලාංකික සමාජ දේහය මත අධිස්ථාපනය කරන ලද්දක් නැතහොත් එයට බද්ධ කරන ලද්දකි. එහි දී, එවකට පැවති පූර්ව ධනේශ්වර සමාජ සංස්ථා ඔවුන්ගේ ආර්ථික සූරාකෑමේ ක්‍රියාවලිය සඳහා භාවිත කළ හැකි අවස්ථාවල දී භාවිත කරනු ලැබූ අතර එම ක්‍රියාවලියට බාධා වන අවස්ථාවල දී ඒවා යටපත් කිරිම හෝ අහෝසි කිරීම කරනු ලැබීය. (බද්ද සංවිධාන පවත්වා ගෙන යාම මුල් කරුණට උදාහරණයක් වන අතර කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණ මගින් රාජකාරි ක්‍රමය අහෝසි කිරීම දෙවැන්නට උදාහරණයකි). මෙම තත්වය මගින් ඇති කරන ලද ප්‍රතිඵලය නිව්ටන් ගුණසිංහ නිරීක්ෂණය කොට ඇත්තේ කුලය සහ පංතිය යන දෙකෙහි පැවැත්ම සහ එකිනෙකෙහි අන්තර් විනිවිදීම හේතුවෙන් ඒවා දෙකෙහිම ස්වභාවය වෙනසකට භාජනය වී ඇති බවයි (ගුණසිංහ 1990: 135). ඒ අනුව, යටත් විජිත පාලන සමය තුළ විවිධ විපරිණාමවලට භාජනය වූ කුලය සහ කුල ක්‍රමය පශ්චාද් යටත් විජිත සමය තුළට ප්‍රවේශ වන්නේ නූතන ප්‍රපංචයක් ලෙසිනි.

## මුහුදුබඩ ප්‍රදේශවල සිදු වූ වෙනස්කම්

යටත් විජිත පාලන සමය තුළ ඇති වූ සමාජාර්ථික වෙනස් වීම කරාව, සලාගම සහ දුරාව යන මුහුදුබඩ කුල උඩුකුරු සමාජ සචලතාව සඳහා පහසු පරිසරයක් නිර්මාණය කළේ ය. මෙම කාලය තුළ කුලවල රැකියා කටයුතු සහ ධූරාවලිගත ස්ථානවල වෙනස් වීම් ඇති වූ බව ජයවර්ධන (2007: 164) පෙන්වා දෙයි. මෙම ජන කොටස් ඉන්දියාවේ සිට ලංකාවට සංක්‍රමණය වූයේ යටත් විජිත පාලන සමය ආරම්භ වීමට පෙර සියවස් කිහිපයේ දී ය. ලංකා සමාජය තුළ ඔවුන්ගේ කෙටි ඉතිහාසය හේතුවෙන් ඔව්හු 'සාම්ප්‍රදායික පද්ධතිය තුළට පූර්ණ වශයෙන් අනුගත නොවූහ' (රොබට්ස් 1973: 280). මෙම තත්වය ගැන ජයවර්ධන පහත දැක්වෙන නිරීක්ෂණය කර ඇත: කරාව, සලාගම සහ දුරාව කුල ගොවිගම කුලයට

'සේවා' සැපයූ කුල නොවූ අතර ඔව්හු බ්‍රිතාන්‍ය පාලන සමයේ පැවති ආර්ථික අවස්ථා උකහා ගත්හ (ජයවර්ධන 2012: 19). තවද, මොවුන්ට සංක්‍රමණය වීම සඳහා පැවති අවකාශයත් තෝරා ගැනීම සඳහා වූ නිදහසත් නිසා ඔවුහු යටත් විජිත පාලනය විසින් විවෘත කරන ලද නව ආර්ථික අවස්ථාවල වාසිය ලබා ගත හැකි තත්වයක පසු වූහ (ජයවර්ධන 2007: 168). ඔවුන් වී වගාව කෙරෙහි අඩුවෙන් බැඳී සිටීම, වෙළඳපොළ සමග සමීප බව, සම්ප්‍රදාය සමග අඩු බැඳීම සහ ආකල්පවල නම්‍යශීලී බව මෙම තත්වය සඳහා හේතු වූ තවත් කරුණු වශයෙන් රොබට්ස් දක්වයි (රොබට්ස් 1973: 280).

පූර්ව යටත් විජිත කුල ක්‍රමයේ සලාගම කුලය සාපේක්ෂව පහත් මට්ටමක පැවති අතර යටත් විජිත සමය තුළ ඇති වූ සමාජාර්ථික පරිවර්තනය හේතුවෙන් ඔව්හු ධූරාවලියේ ඉහළ මට්ටමක් අත් කරගත්හ. ද සිල්වා මෙය දකින්නේ කුරුඳු ඒකාධිකාරය කෙරෙහි සලාගමයන්ගේ වටිනාකම හේතු කොට ගෙන ඔවුනට එතෙක් නොපැවති ආකාරයේ වරප්‍රසාද විශාල ප්‍රමාණයක් හිමි වූ බවයි (ද සිල්වා 2005: 319). කොතලාවල (1968: 318-19) සහ මලල්ගොඩ (1976: 94) ද මෙම තත්වය නිරීක්ෂණය කරති. 1708 දී ප්‍රථම වරට සලාගම කුලයට මුදලි තනතුරක් ප්‍රදානය කරනු ලැබීම, ඔවුන්ට 19 වන සියවස ආරම්භය වන විට ලංකාවේ නිරිත දිග ප්‍රදේශයේ කුල ධූරාවලියේ ඉහළම මට්ටමට හිමිකම් පෑමට හැකියාවක් ඇති කරන ලද බව කොතලාවල ප්‍රකාශ කරයි (කොතලාවල 1988: 67). මෙම තත්වය ගැන දක්වන ජයවර්ධන (2007: 25) සඳහන් කරන්නේ කුරුඳු ක්ෂේත්‍රයේ විදේශික පාලකයන්ට සැපයූ සේවා මගින් සලාගමයන් ඉඩම් සහ තත්වය යන දෙකම අත් කරගත් බවයි.

රොබට්ස් ඉහත තත්වයට සමාන්තර තත්වයක් කරාව කුලය සම්බන්ධයෙන් මෙසේ දක්වයි: 'ඔවුන්ගේ ආර්ථික සාර්ථකත්වයේ ප්‍රතිඵලය වශයෙන් 19 වන සියවස අග වන විට කරාව ප්‍රභූන්ගේ තත්වය සහ බලය ඕලන්ද යුගයේ අවසානයේ සහ බ්‍රිතාන්‍ය යුගයේ මුල් කාලයේ පැවතියාට වඩා හාත්පසින්ම වෙනස් විය' (රොබට්ස් 1995: 10). ද සිල්වා ප්‍රකාශ කරන්නේ 18 වන සියවස අග සහ 19 වන සියවස මුල සලාගම

කුලය දූරූ තත්වයට සමාන මට්ටමකට 19 වන සියවස අග භාගය වන විට කරාව කුලය ළඟා වූ බවයි (ද සිල්වා 2005: 424). කරාව ජනතාව විසින් ඉටු කරන ලද ක්‍රියා ඕලන්ද පාලනයට පවා විශාල වශයෙන් වැදගත් විය. උදාහරණ වශයෙන් මුහුදුබඩ සහ රට තුළ ප්‍රවාහන කටයුතු, තොටුපලවල බඩු පැටවීම සහ බෑම ආදිය දැක්විය හැක (කොතලාවල 1988: 64-5). කාර්මිකයන්ගේ ප්‍රධාන කොටස කරාව කුලයේ වූ අතර ඔව්හු වඩු කර්මාන්තය සහ බෝට්ටු තැනීම ආදියෙහි විශේෂඥතාවක් දැක්වූහ. ඕලන්ද පාලකයන්ගේ අනුග්‍රහය යටතේ ද ඔවුන්ට යම් ප්‍රාග්ධනයක් ඒකරාශි කර ගත හැකි විය (ජයවර්ධන 2007: 21).

පූර්ව ධනේශ්වර සේවා මත වූ බැඳීමක් නොමැති වීම, ඕලන්ද යුගයේ රැකියා විවිධාංගීකරණය වීම ඉහත කී පරිදි ධනයක් ඒකරාශි කර ගැනීමට හේතු විය. ඔවුහු බ්‍රිතාන්‍ය යුගයේ උදා වූ ආර්ථික අවස්ථාවල යෙදීමට තරම් ආර්ථික වශයෙන් ශක්තිමත් වූහ. කරාව කුලයේ ආර්ථික සමෘද්ධිය සඳහා විශේෂ හේතුවක් වූයේ මත්පැන් වෙළඳාමයි (ජයවර්ධන 2007: 42, රොබට්ස් 1995: 108). ජයවර්ධන තව දුරටත් පෙන්වා දෙන්නේ 1832 දී මුලාදෑනීන්ට අරක්කු රේන්ද කටයුතුවල යෙදීම තහනම් කිරීම මගින් ඉන් පසු කාලයේ දී කරාව කුලය අරක්කු රේන්ද කටයුතුවල ආධිපත්‍යධාරී තත්වයකට පත්කරන ලද බවයි (ජයවර්ධන 2007: 54).

වතු වගාවේ ආරම්භය ද කරාව කුලයට දෙයාකාරයකින් වාසි ගෙන දුන්නේ ය. එක් අතකින් වතුවල මෙන්ම නාගරික අංශයේ ද කම්කරුවන් සඳහා අරක්කු වෙළඳාම පුළුල් වීමක් සිදු වූ අතර අනෙක් අතින් වතු වගාවම ධනෝත්පාදන මාර්ගයන් විය (ජයවර්ධන 2007: 50). පැට්රික් පීබ්ල්ස් දක්වන්නේ කරාව කුලයට සිංහල සමාජයේ ප්‍රභූ තත්වයක් ඇති වන්නේ කෝපි වගාවේ සාර්ථකම අවධිය වූ 1870 ගණන්වල දී බවයි. එය නම්බුව සහ බලය අතින් කරාව කුලයේ සාර්ථකම වූ අවධිය බවයි (පීබ්ල්ස් 1995: 263).

යටත් විජිතවාදී සමාජාර්ථික පරිණාමය හමුවේ ලාංකේය කුල ක්‍රමයෙහි සිදු වූ වෙනස් වීම පිළිබඳ පීරිස්ගේ නිරීක්ෂණය ඉහත තත්වය සූත්‍රගත කර දක්වයි: 'දහනව වැනි සියවසේ අගභාගයේ දී පැන නැඟි කුලවාද වැනි දේ මහනුවර යුගයේ දී නම් නොසිතන ලද විරූ ය. යම් කිසි පහත්

කුලයක් තමන් කීර්තිමත් ආදි පුරුෂයකු ගෙන් පැවතෙන්නන් බව පැවසුව ද 'වැදගත්' උදවියට වඩා තමන් උසස් යැයි රහසේ වුව ද නොකියනු ඇත. එහෙත් දහනව වැනි සියවසේ අපරභාගයේ දී කරාවේ පත්‍රිකාකරුවෝ ප්‍රජාතන්ත්‍රවාදයේ සෙවණ යටතේ ආරක්ෂාව ලබාගෙන, තම කුලය අන් කිසි ම කුලයකට – "වැදගත් උදවියට" ද – නොදෙවෙනි බව පැවසූ හ' (පීරිස් 2001: 190).

යටත් විජිත සමය තුළ ව්‍යාප්ත වූ ප්‍රවාහන සේවා නිසා පූර්ව යටත් විජිත සමයේ කුල අතර පැවති දූරස්ථභාවය පවත්වා ගැනීමේ අවකාශය දුර්වල කෙරුණි. කන්නන්ගර මේ පිළිබඳව මෙසේ පවසයි: '19 වැනි සියවසේ දුම්රිය ගමනාගමනයත්, 20 වැනි සියවසේ බස් ගමනාගමනයත් ඇති වුණා. දුම්රිය මැදිරියේ හෝ බස්වල කුල භේද පැවැත්වීමට ඉඩක් තිබුණේ නැහැ' (කන්නන්ගර 1965: 28). කර්මාන්ත ශාලා බිහි වීමත් ඒවායේ රැකියා සැමට විවෘත වීමත් නිසා සියලු කුලවල තැනැත්තන්ට එක්ව වැඩ කිරීමට සිදු වීම හේතුවෙන් කුල අතර දූරස්ථභාවය පවත්වා ගැනීමේ හැකියාවක් නොවීය.

නාගරීකරණය හේතුවෙන් විවිධ ග්‍රාමීය ප්‍රදේශවලින් පැමිණි පුද්ගලයන්ට නාගරික පරිසරය තුළ කුලවලට වෙන් වූ ප්‍රදේශ පවත්වා ගනිමින් පදිංචි වීමේ හැකියාවක් නොවීය. එම සාධකය ද නාගරික සන්දර්භය තුළ කුල දූරස්ථභාවය බිඳ වැටීමට හේතු විය. නාගරික ආපන ශාලාවල ආහාර ගැනිමේ දී උස් පහත් භේදයකින් තොරව සියල්ලන්ට එක ස්ථානයක ආහාර ගැනීමට සිදු වූ අතර එමගින් සහභෝජිත්වය පිළිබඳ තහංචිය පවත්වා ගත හැක්කක් නොවීය.

ප්‍රජාතන්ත්‍රවාදය සමාජගත වීම ද කුලය සම්බන්ධයෙන් වැදගත් වෙනසකට මග පාදන ලදී. පූර්ව යටත් විජිත යුගයේ සිට පවත්වා ගෙන ආ ඇඳුම් පැළඳුම් පිළිබඳ රීති මෙන්ම ආමන්ත්‍රණය කිරීමේ රීති ආදිය ද ප්‍රජාතන්ත්‍රවාදයේ සාරධර්ම සමග පැවති පරස්පරතාවය හේතුවෙන් ක්‍රමයෙන් අභාවයට ගියේය.

## උඩුකුරු සමාජ සචලතාව

යටත් විජිත පාලන සමය තුළ ඇති වූ සමාජාර්ථික වෙනස් වීම හේතුවෙන් කරාව සලාගම සහ දුරාව යන කුලවල සිදු වූ උඩුකුරු සමාජ සචලතාව හුදු පුද්ගල බද්ධ සචලතාවකට වඩා සමස්ත කුල ප්‍රජාවක සචලතාවක් වශයෙන් හැඳින්විය හැක. වෙනත් වචනවලින් කිවහොත්, මෙම කුලවල අය තනි පුද්ගලයන් වශයෙන් සමාජයේ ඉහළ මට්ටමකට හිමිකම් පෑමකට වඩා සම්පූර්ණ කුලය වශයෙන් ඉහළ මට්ටමකට හිමිකම් පෑමක් සිදුව ඇත.

මත්පැන් ව්‍යාපාර වර්ධනයේ දී ඥාතිත්වය සහ කුලය බෙහෙවින් ප්‍රයෝජනයට ගනු ලැබීය (ජයවර්ධන 2007: 111). මෙම තත්වය තවදුරටත් පැහැදිලි කරන රොබට්ස් ප්‍රකාශ කරන්නේ ඔහුගේ අධ්‍යයනයට විෂය වන කාලපරිච්ඡේදය (එනම් 1500 - 1931) තුළ කරාව කුලයේ ව්‍යාපාරිකයන් රැකියාවලට බඳවා ගැනීමේ දී ස්වකීය කුලයට අනුග්‍රහය දැක්වූ බවයි (රොබට්ස් 1995: 127). ඔහු තව දුරටත් දක්වන්නේ ආර්ථික ප්‍රතිලාභ කුලය තුළම පැතිරීම මගින් කුලයක් වශයෙන් උඩුකුරු සමාජ සචලතාව ලබා ගැනීමට හැකි වූ බවත් ය (රොබට්ස් 1995: 286).

ජයවර්ධන ද මේ පිළිබඳව මෙසේ නිරීක්ෂණය කරයි: 'විසිවන සියවසේ මුල් කාලයේ ඇරඹී දිගින් දිගට ක්‍රියාත්මක වූ ඉංග්‍රීසි උගත් තරුණයන් දකුණේ ගම්වලින් විශාල වශයෙන් කොළඹට සංක්‍රමණය වීම කැපී පෙනෙන්නක් විය. කුල සහ ඥාති සම්බන්ධතා ඔවුන් ගමෙහි රඳවා තබා ගැනීම වෙනුවට ඔවුන්ට ගමෙන් පිට වීම සඳහා උපකාරී විය. කොළඹ රැකියා අවස්ථා උදා කර ගෙන තිබුණ අය එහි දී ඔවුන්ගේ ඥාතීන්ට උදව් කිරිම මගින් ඔවුන්ගේ ගමින් පිටවීම දිරිමත් කළහ' (ජයවර්ධන 2012: 26-27).

යටත් විජිත පාලනය පවත්වා ගැනීම සඳහා අවශ්‍ය ස්වදේශීය සේවකයන් බිහි කර ගැනීම සඳහා යටත් විජිත පාලනයට නතු වූ ප්‍රදේශවල අධ්‍යාපන අවස්ථා ඇති කිරීම ද සිදු විය. බ්‍රිතාන්‍ය යුගයේ දී ඉංග්‍රීසි මාධ්‍ය අධ්‍යාපන සඳහා ප්‍රවේශය විවෘත කරනු ලැබීම ද ඉහත කුල තුනට වාසිදායක තත්වයක් ගෙන දුන්නේ ය. යටත් විජිත පාලනය

බිහි කරන ලද ආර්ථික අවස්ථා හේතුවෙන් කරාව, සලාගම සහ දුරාව කුලවල තැනැත්තන් එක් රැස් කරගත් ආර්ථික ප්‍රාග්ධනය ඊළඟ පරපුරේ අධ්‍යාපනය සඳහා, විශේෂයෙන්ම, විදේශීය අධ්‍යාපනය ද ඇතුළත්ව වැදගත් සහ සමාජීය වටිනාකමකින් යුත් වෘත්තීන්ට යොමු වන අධ්‍යාපනයක් සඳහා යොදා ගැනුණි. මෙය ආර්ථික ප්‍රාග්ධනය සංස්කෘතික ප්‍රාග්ධනයට පරිවර්තනය කිරීමකි.[1] අධ්‍යාපන පහසුකම්වල ව්‍යාප්තියත් සමග 2 වන සහ 3 වන පංතියේ ගොයිගම තැනැත්තන්ට සහ ගොයිගම නොවන්නන්ට එකී පහසුකම් මගින් උඩුකුරු සමාජ සචලතාවට මාර්ගයක් වශයෙන් නම්බුකාර රැකියාවලට ප්‍රවේශ විය හැකි විය. මෙම ගොයිගම නොවන්නන් අතරින් කැපී පෙනෙන්නේ කරාව, සලාගම සහ දුරාව කුලවලට අයත් පුද්ගලයන් සහ පවුල් ය (රොබට්ස් 1995: 11). ලංකාවේ මුල්ම වෛද්‍යවරියන් තිදෙනා සලාගම කුලයේ තැනැත්තියන් වීම මෙම තත්වය සඳහා තවත් සාක්ෂියක් වෙයි (ජයවර්ධන 2012: 132).

පීබ්ල්ස් කරාව කුලය සම්බන්ධයෙන් මෙම තත්වයට අදාළ වැදගත් උදාහරණයක් දක්වයි: 19 වන සියවස මුල් භාගයේ දී සිංහල නීතිඥයන් මුදලිවරුන්ගේ පවුල්වල අය වූ නමුත් එම සියවසේ දෙවන භාගය වන විට කරාව කුලයේ ධනවතුන් ඔවුන්ගේ තැන ගත් අතර කරාව නීතිඥයන්ගේ සංඛ්‍යාව ගොයිගම නීතිඥ සංඛ්‍යාව ඉක්ම වූ බවයි (පීබ්ල්ස් 1995: 260).

දෙවන පරපුර තුළින් සමාජමය වශයෙන් ආකර්ෂණීය සහ ගෞරවනීය වෘත්තිකයන් බිහි වීමත් එකී වෘත්තීන් සඳහා පැවති ආර්ථික අවකාශත් විමසීමේ දී ප්‍රකාශ කළ හැක්කේ ඒ වන විට වෘත්තීය නිපුණතා මගින්

[1] ආර්ථික ක්ෂේත්‍රයෙන් ඔබ්බෙහි ද ප්‍රාග්ධනය යන්න අර්ථ ගන්වන පියරේ බෝර්දියු, ආර්ථික (economic), සංස්කෘතික (cultural) සහ සමාජීය (social) ප්‍රාග්ධනය වශයෙන් පුළුල් අයුරින් ප්‍රාග්ධනය යන්න සංකල්ප ගත කරයි. ප්‍රාග්ධනයේ එක් ආකාරයක් වෙනත් ආකාරයකට පරිවර්තනය කළ හැක. මෙම ආකාර තුනම සංකේතමය ප්‍රාග්ධනය (symbolic capital) බවට ද පරිවර්තනය කළ හැක. ආර්ථික ප්‍රාග්ධනයට මුදල් සහ දේපල ද, සංස්කෘතික ප්‍රාග්ධනයට අධ්‍යාපනය, නිපුනතා, සෞන්දර්යාත්මක රුචිය ද සමාජීය ප්‍රාග්ධනයට සම්බන්ධතා ජාල, බැඳියා,ලැදියා ආදිය ද සංකේතමය ප්‍රාග්ධනයට කීර්තිය, ගෞරවය, ආධිපත්‍යයේ සුජාතභාවය ද අයත් වෙයි.

ධනය ඉපයීමේ විභවයක් පැවති බවයි. එය අධ්‍යාපනය ලෙසින් උපයා ගත් සංස්කෘතික ප්‍රාග්ධනය ආර්ථික ප්‍රාග්ධනය සහ සංකේතමය ප්‍රාග්ධනය (symbolic capital) බවට පරිවර්තනය කිරීමකි. මෙම තත්වය එකී කුලවල උඩුකුරු සමාජ සචලතාව සඳහා හොඳින්ම ඉවහල් වූ බව පැහැදිලි ය.

යටත් විජිත පාලන සමයේ දී ආර්ථික ක්ෂේත්‍රයේ ඉදිරියට පැමිණියා මෙන්ම සමාජීය ක්ෂේත්‍රයේ ද කැපී පෙනෙන ප්‍රගතියක් අත් කර ගැනිමට මෙම කුල සමත් විය. එක් අවස්ථාවක දී මුදලි ක්‍රමයේ ඉහළම තනතුර වන මහමුදලි තනතුර ගොයිගම නොවන්නෙකු දරූ බව පීබ්ල්ස් පෙන්වා දෙයි (1995: 259). පුණ්‍ය කටයුතු සහ පොදු කටයුතු සඳහා දායක වීම මගින් ඔවුන්ට එක් අතකින් යටත් විජිත පාලකයන්ගෙන් නම්බුනාම සහ තනතුරු ආදිය ලබා ගත හැකි වූ අතර අනෙක් අතින් ආණ්ඩුකාරවරයා, බිෂොප්වරු සහ නිලධාරිතන්ත්‍රය සමග සබඳතා ඇති කර ගත හැකි විය. කරාව සලාගම සහ දුරාව කුලවලින් බිහි වූ යටත්විජිතවාදී ධනේශ්වර පංතිය නැතහොත් නව ධනවත්තු රදළ ප්‍රභාව දක්වමින් ජීවත් වීමේ අභිරුචියක් දැක්වූහ. ඔවුනට යටත්විජිත පාලකයන්ගෙන් ලැබුණ මුදලි මුහන්දිරම් තනතුරු මත ඔවුන් රදළ ස්වභාවය ආරෝපණය කරගත්තත් ඔවුහු සාම්ප්‍රදායික අර්ථයෙන් රදළයෝ නොවූහ (ජයවර්ධන 2007: 308, 311).

ද සොයිසා මෙම තත්වය විග්‍රහ කිරීමට රදළකරණය (*aristocratization*) යන සංකල්පය යොදා ගනී (ද සොයිසා 2012: 16, 56). මෙය ඉන්දියානු සන්දර්භය තුළ එම්. එන්. ශ්‍රීනිවාස් විසින් ඉදිරිපත් කරන ලද සංස්කෘතකරණය (*sanskritization*) යන සංකල්පය ආශ්‍රයෙන් ගොඩනගන ලද්දකි[2]. ධූරාවලියේ පහළ කුලයක් ඉහළ කුලයක චාරිත්‍ර, වතාවත්, ඇදහිලි, මතවාද සහ ජීවන රටා ආදිය කාලයක් තිස්සේ අනුගමනය කිරීම මත උඩුකුරු සමාජ සචලතාව ලබා ගැනීමේ ක්‍රියාවලිය සංස්කෘතකරණය යනුවෙන් අදහස් වේ (ශ්‍රීනිවාස් 2010: 222). මෙම ලිපියේ ඉහතින් ද සඳහන් කර ඇති පරිදි ඉන්දියානු කුල ක්‍රමයට

[2] ලාංකේය සන්දර්භය තුළ ශ්‍රීනිවාස්ගේ සංකල්පය වෙනස් කර ගත යුතු බව කොතලාවල දක්වා ඇත (1968: 317-8).

විශාල ආගමික පදනමක් තිබීමත් ලාංකේය කුල ක්‍රමය ප්‍රධාන වශයෙන්ම ලෞකික එකක් වීමත් හේතුවෙන් ලාංකේය සන්දර්භය තුළ සංස්කෘතකරණ ක්‍රියාවලිය සඳහා අවකාශයක් නොමැත. ඒ වෙනුවට ලංකාවේ සිදු වූයේ රදළකරණ ක්‍රියාවලියයි.

කරාව, සලාගම සහ දුරාව කුලවල නව ධනවත්තු සාම්ප්‍රදායික රදළයන් අනුකරණය කිරීමෙහි යෙදුනහ. ඔවුහු ගොයිගම රදළ ප්‍රභූන්ගේ වලව් ආකෘති කොට ගත් මන්දිර තැනූහ. උණවටුනේ අමරසූරිය වලව්ව, බලපිටියේ මහ කප්පින වලව්ව, දික්වැල්ලේ මුහන්දිරම් වලව්ව සහ තිහගොඩ වාසල වලව්ව[3] මේ සඳහා උදාහරණ වේ. ආගමික සහ වෙනත් පුණ්‍ය කටයුතු සඳහා අනුග්‍රහය දැක්වීම, දෝලාවලින් ගමන් කිරීම සහ කුලවල ප්‍රභවය පිළිබඳ මිත්‍යා ප්‍රබන්ධ (myths) ලේඛනගත කරන් ලැබීම ද මෙම ක්‍රියාවලියේම අංග වේ. පහතරට කුලවල නව ධනවතුන් රදළකරණයේ අංගයක් වන දෝලාවල ගමන් කිරීම ගොයිගම රදළයන්ගේ විරෝධයට ලක් විය. ඩොයිලි මෙය දක්වන්නේ නියම ගොයිගම මුදියන්සේලාට හැර පහතරට කිසිදු තැනැත්තෙකුට උඩරට දී දෝලාවල යාමට ඉඩ නොදිය යුතු බවට උඩරට රදළයන් ආණ්ඩුකාරවරයාට කියා සිටි බවයි (කොඩ්රිංටන් 1917: 240).

වර්ෂ 1803 දී අමරපුර නිකාය ස්ථාපනය කරනු ලැබීම ද කරාව සලාගම සහ දුරාව කුලවල උඩුකුරු සමාජ සචලතාව යන කාරණයෙහි දී වැදගත් සංසිද්ධියකි. තවද, එය යටත් විජිත සමයේ දී සිදු වූ සමාජාර්ථික වෙනස්කම් හේතුවෙන් කුලය නම් ප්‍රපංචයෙහි සිදු වූ විපර්යාසය විශද කරන්නකි. ලාංකේය සංස්කෘතික සන්දර්භය තුළ, කිසියම් ප්‍රජාවක පූජ්‍ය පක්ෂයේ සාමාජිකයන්ගේ පැවැත්ම එම ප්‍රජාවට ගරුත්වයක් හෝ සමාජීය වටිනාකමක් ගෙන දෙයි. එම හේතුව නිසාම එකී කුල තම කුලය සඳහා විශේෂිත නිකායක් හෝ අනුනිකායක් බිහි කර ගැනීමට උත්සුක වී ඇත. අමරපුර නිකායේ ස්ථාපනය සඳහා හේතු වන්නේ සියම් නිකායේ ප්‍රධාන මට්ටමේ භික්ෂූන්ගේ අවශ්‍යතාව අනුව කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් වර්ෂ 1762 දී පනවන ලද ආඥාවකි. එමගින් සියම්

[3] මාතර තිහගොඩ ප්‍රදේශයේ පැවති දුරාව කුලයට අයත් වාසල වලව්ව වර්තමානයේ දැක ගත නොහැක.

නිකායේ උපසම්පදාව ගොයිගම කුලයට පමණක් සීමා කෙරුණි. අමරපුර නිකාය පිහිටුවීම එයට දක්වන ලද ප්‍රතිචාරයකි. අමරපුර නිකාය පිහිටුවීම සඳහා බුරුමයට ගොස් උපසම්පදාව ලබා ගැනීමට මූලිකත්වය ගත් අඹගහපිටියේ ඥාණවිමල හිමි සලාගම කුලයට අයත් භික්ෂුවක වූ අතර 'ඥාණවිමල හිමියෝ වැලිතර අවට ගම්මානවල ක්‍රියාකාරී වූ මහබද්ද දෙපාර්තමේන්තුවේ ප්‍රධාන මුලාදෑනි පවුල් කිපයකට ඥාතිත්වයෙන් බැඳී සිටියහ' (ද සිල්වා 2019: 18). මලල්ගොඩ ද මෙම තත්වය සනාථ කරයි (1976: 88, 97-98). බුරුමයට ගොස් උපසම්පදාව ලබා ගැනීම සඳහා අවශ්‍ය වියදම් දැරුවේ සලාගම කුලයේ පිරිසකි. ඔවුන් ඕලන්ද යුගයේ දී සලාගම කුලයට ලැබුණ අනුග්‍රහය හේතුවෙන් ධනවත් වූ පිරිසක් බව ද කිව යුතුය. ඉන් පසු, අමරපුර නිකායේම තවත් කණ්ඩායම් කීපයක් බුරුම දේශයට ගොස් උපසම්පදාව ලබා පැමිණි අතර ඔවුන් කරාව, සලාගම සහ දුරාව කුලවලට අයත් වූවන් ය. ඔවුන්ට ද අනුග්‍රහය දක්වන ලද්දේ තම කුලයේ ධනවතුන් විසිනි. මේ අනුව බලන විට අමරපුර නිකාය ස්ථාපනය කරනු ලැබීම මුහුදුබඩ කුලවල උඩුකුරු සමාජ සචලතාව සඳහා දැරූ ප්‍රයත්නයක් ලෙස සැලකිය හැක. නිකායක නායක ස්වාමීන්වහන්සේ කෙනෙකුගේ පැවැත්ම ඔහු අයත් ප්‍රජාවට සංකේතාත්මක වටිනාකමක් (symbolic value) ගෙන දෙන්නකි. බෝර්දියුගේ ප්‍රාග්ධනය[4] පිළිබඳ මතය අනුව මෙය ආර්ථික ප්‍රාග්ධනය සංකේතමය ප්‍රාග්ධනය (symbolic capital) බවට හැරවීමකි. මෙය උඩුකුරු සමාජ සචලතාව සඳහා විශාල දායකත්වයක් සැපයීය.

## පශ්චාද් යටත් විජිත සමය

යටත් විජිත සමයේ දී කරාව, සලාගම සහ දුරාව කුලවලට ලැබුණ ආකාරයේ උඩුකුරු සමාජ සචලතාවක් ලබා ගැනීමේ අවස්ථාවක් පශ්චාද් යටත් විජිත සමයේ දී කිසිදු කුලයකට අත් කර ගත නොහැකි විය. කිසිදු කුලයකට සුවිශේෂී වශයෙන් වාසි සහගත ආකාරයේ ආර්ථික අවස්ථා බිහි වීමක් පශ්චාද් යටත් විජිත සමයේ දී දැක ගත නොහැක.

[4] ඉහත අංක 1 පාද සටහන බලන්න.

පශ්චාද් යටත් විජිත සමයේ දී උඩුකුරු සමාජ සචලතාව ලබා ගැනීම සඳහා ජනප්‍රිය, කැපී පෙනෙන සහ ඵලදායී මාර්ගය වූයේ දේශපාලන අනුග්‍රහයයි. ගුණසිංහ පෙන්වා දී ඇති පරිදි රැකියා, රජයේ යෝජනා ක්‍රමවලින් ඉඩම්, බැංකු ණය ආදිය ලබා ගැනීමේ දී ප්‍රදේශයේ මන්ත්‍රීවරයාගේ අනුග්‍රහය අවශ්‍යම වූ බවයි (ගුණසිංහ 1990: 215). ඉතාමත් පැහැදිලිව පෙනෙන තත්වය නම් පශ්චාද් යටත්විජිත සමය තුළ ගොයිගම, කරාව, සලාගම සහ දුරාව යන කුල හැර අන් කිසිදු කුලයක් සඳහා ප්‍රමාණවත් දේශපාලන නියෝජනයක් නොලැබුණ බවයි. මේ පිළිබඳව තාරා කුමාරස්වාමිගේ නිරීක්ෂණය වන්නේ ගොවිගම කුලය මෙන්ම කරාව, සලාගම සහ දුරාව යන කුල ද ජනගහන අනුපාතයට වඩා වැඩියෙන් නියෝජනය වූ නමුත් බත්ගම සහ වහුම්පුර කුලවලට ලැබුණේ ඉතා අඩු නියෝජනයක් බවයි (1988: 241).

එබැවින්, පශ්චාද් යටත් විජිත ශ්‍රී ලංකාවේ ධූරාවලියේ පහළින් ඇති කිසිදු කුලයකට උඩුකුරු සමාජ සචලතාවක් ලබා ගත හැකි ආකාරයේ දේශපාලන නියෝජනයක් නොලැබුණි. ඇතැම් අවස්ථාවල දී මෙම කුලවලට අයත් ඇතැම් පුද්ගලයන්ට සහ පවුල්වලට සුවිශේෂී වශයෙන් බලපෑ තත්ව යටතේ උඩුකුරු සමාජ සචලතාවක් ලබා ගත හැකි වූ නමුත් යටත් විජිත සමයේ දී කරාව, සලාගම සහ දුරාව යන කුල ලබා ගත් ආකාරයේ කුලයක් වශයෙන් කුල ධූරාවලිය තුළ උඩුකුරු සමාජ සචලතාවක් ලබා ගැනීමේ අවකාශයක් නිර්මාණය නොවුණි.

## කුලයේ නූතනකරණය

ඉහත විස්තර කරන ලද ආකාරයෙන්, පශ්චාද් යටත් විජිත අවධිය වන විට කුලය යන ප්‍රපංචය පරිණාමීය ක්‍රියා දාමයකට භාජනය වී ඇති බව පැහැදිලිය. එහි දී යටත් විජිත කුලයෙහි අංග ගණනාවක් ගිලිහී ගොස් ඇත. අතැම් අංග ශේෂ වී ඇත.

සාම්ප්‍රදායික කුල සේවා අහෝසි වී ඇත. රැකියා අවස්ථා සඳහා කුලයෙහි බලපෑමක් නැත. සහභෝජනය පිළිබඳ තහංචි ඉවත් වී ඇත. ඇඳුම් පැළඳුම්, කොණ්ඩය සහ රැවුල කැපිය යුතු ආකාරය, ආමන්ත්‍රණ

විධි ආදිය පිළිබඳ සාම්ප්‍රදායික කුල රීති අභාවයට ගොස් ඇත. කුල ධූරාවලිය, කුල කණ්ඩායමකට අයත් ය යන හැඟීම නැතහොත් අපේකම පිළිබඳ හැඟීම ආදී අංග ශේෂව ඇත.

පූර්ව යටත් විජිත කුලය පැහැදිලි ලෙස හඳුනා ගත හැකි අංග දෙකකින් සමන්විත විය. භෞතික අංගය සහ දෘෂ්ටිවාදාත්මක අංගය (physical aspect and ideological aspect) යනුවෙනි. පශ්චාද් යටත් විජිත අවධිය වන විට යටත් විජිත විපර්යාසය හේතුවෙන් අහෝසි වී ඇත්තේ කුලයේ භෞතික අංගය පමණි. දෘෂ්ටිවාදාත්මක අංගය එසේම පවතී. ඒ අනුව, පශ්චාත් යටත් විජිත කුලය පැහැදිලිවම පූර්ව යටත් විජිත කුලයෙන් වෙනස් වෙයි. පශ්චාත් යටත් විජිත කුලය නූතන ප්‍රපංචයක් බවට පත්ව ඇත.

මේ අයුරින් කුලයේ භෞතික අංගය අභාවයට යවන අතර දෘෂ්ටිවාදාත්මක අංගය පවත්වා ගෙන යමින් කුලය යන ප්‍රපංචය වෙනස් වීමට භාජනය කරමින් එය නූතන ප්‍රපංචයක් බවට පත් කරන ලද මෙම ක්‍රියාවලිය කුලයේ නූතනකරණය ලෙස හැඳින්විය හැක.

දැන් මෙම ලිපිය ආරම්භයේම සටහන් කරන ලද කුලය පිළිබඳ සාම්ප්‍රදායික මත පිළිබඳව අවධානය යොමු කරමු. නූතනකරණය වූ කුලය නිර්වචනය කිරිමට හෝ විග්‍රහ කීරීමට ඒවා අපොහොසත් බව පැහැදිලි ය. සාම්ප්‍රදායික මත මගින් කුලයේ අවියෝජනීය අංග වශයෙන් සඳහන් කරන්නා වූ භෞතික අංග මේ වන විට අභාවයට ගොස් ඇති බැවිනි. එබැවින් නවීකරණය වූ කුලය සඳහා නව නිර්වචනයක් අවශ්‍ය ය.

## නවීකරණය වූ කුලය සඳහා නිර්වචනය

නවීකරණය වූ කුලය සඳහා පහත දැක්වෙන නිර්වචනය ඉදිරිපත් කළ හැකː

*කුලය යනු සමාජීය වශයෙන් පරිකල්පිත, ගරුත්වයේ සහ නම්බුවේ මට්ටම අනුව ධූරාවලිගත සමාජ ප්‍රවර්ගයකි.*

මෙම නිර්වචනය තමරා ගුණසේකර, ජයදේව උයන්ගොඩ සහ නිර්මාල් රංජිත් දේවසිරි (2008) විසින් ඉදිරිපත් කරන ලද අදහස්වල සංශ්ලේෂණයකි. ගුණසේකරගේ නිර්වචනය වන්නේ කුල යනු සමාජ ගරුත්වයේ සහ නම්බුවේ වෙනස් මට්ටම් දරන්නා වූ කණ්ඩායම් ය යන්නයි (ගුණසේකර 1994: 7). උයන්ගොඩ කුල ප්‍රජා සමාජ සුළුතර (social minorities) වශයෙන් දක්වයි (උයන්ගොඩ 200: 16) බෙනඩික්ට් ඇන්ඩර්සන්ගේ ජාතියක් යනු පරිකල්පිත දේශපාලන ප්‍රජාවකි යන නිර්වචනය මත පදනම්ව දේවසිරි කුලය පරිකල්පිත ප්‍රජාවක් වශයෙන් දක්වයි (දේවසිරි 2008: 196).

## කුලය වියැකෙමින් පවතී ද?

කුලය වියැකෙමින් පවතින බවට මතයක් පවතී. මෙම මතය ගෙන එන්නවුන් බොහොමයක් ඒ සඳහා පදනම් කර ගන්නේ කුලය පිළිබඳ සම්භාව්‍ය මතය මත පිහිටමිනි. කුලයේ භෞතික අංගය එහි දෘෂ්ටිවාදාත්මක අංගයෙන් වෙන් කොට ගෙන එයට අනවශ්‍ය ප්‍රමුඛත්වය දීම මේ සඳහා හේතු වී ඇත. මෙය කුලයේ භෞතික අංග අභාවයට යාම කුලය අභාවයට යාමක් සේ වරදවා දැකීමකි. ඉහත විස්තර කරන ලද ආකාරයෙන් කුලය නූතන ප්‍රපංචයකි. අද එය නිර්ණය වන්නේ දෘෂ්ටිවාදාත්මක අංගයෙනි. නූතන ප්‍රපංචයක් වන එයට තව දුරටත් පැවතීම සඳහා ඉඩ කඩ පවතී. එය වියැකී යාමට අවශ්‍ය තත්ව සහ කොන්දේසි තවමත් නිර්මාණය වී නොමැත.

කිසිදු සමාජ පද්ධතියක් මේ අයුරින් අවසන් වන්නේ නැත. වඩා ප්‍රයෝජනවත් වන්නේ ආරම්භක ප්‍රශ්නය වශයෙන් නූතන දේශපාලනයේ බලපෑම යටතේ කුලය කවර ආකාරයක් ගන්නේ ද කුල නැඹුරුවක් ඇති සමාජයක දේශපාලනය කවර ආකාරයක් ගන්නේ ද යන්න නැගීමයි යනුවෙන් රජ්නි කොතාරි විසින් පවසන ලද අදහස ලිපියේ සමාප්තිය වශයෙන් සටහන් කිරීම උචිත යැයි හැඟේ.

## ආශ්‍රිත ග්‍රන්ථ


Bandarage, Asoka, 1985. *Colonialism in Sri Lanka*. Lake House.

Codrington, H. W. (ed), 1917. *The Diary of Mr. John D'Oyly*. Royal Asiatic Society (Ceylon).

Coomaraswamy, Tara, 1988. *Parliamentary Representation in Sri Lanka 1931-1986*, unpublished Ph.D. thesis. University of Sussex.

De Silva, K. M., 2005. *A History of Sri Lanka*. Vijitha Yapa Publications.

De Zoysa, K. P., 2012. *Caste Matters: Democracy, Caste and Politics in Sri Lanka after the Promulgation of 1978 Constitution: A Case Study of Sinhala Society*.

Dewasiri, N. R., 2008. *The Adaptable Agrarian Society in Western Sri Lanka under the Dutch Rule*. Brill.

Dumont, Louis, 1999. *Homo Hierarchicus*. Oxford University Press

Ghurye, G. S., 2008. 'Features of Caste System', *Cast and Democratic Politics*, ed. Ghanshyam Shah. Permanent Black.

Gunasekera, T., 1994. *Hierarchy and Egalitarianism: Caste, Class and Power in Sinhalese Peasant Society*. Athlone Press.

Gunasinhge, N., 1990. *Changing Socio-Economic Relations in the Kandyan Countryside*. Social Scientists' Association.

Jayawardena, Kumari, 2007. *Nobodies to Somebodies*. Social Scientists' Association and Sanjiva Books

Jayawardena, Kumari, 2012. *A. P. de Zoysa*. Sanjiva Books.

Kotelawela, D. A., 1968. *The Dutch in Ceylon 1743-66*, unpublished Ph.D. thesis. University of London.

Kotelawela, D. A., 1988. 'Some Aspects of Social Change in the South West of Sri Lanka C. 1700-1833'. *Social Science Review* no. 4.

Kothari, R., 2000. 'Caste and Modern Politics', *Politics in India*, ed. S. Kaviraj. Oxford University Press.

Leach, E. R., 1979. *Aspects of Caste in South India, Ceylon and North-West Pakistan*. Cambridge University Press.

Malalgoda, Kithsiri, 1976. *Buddhism in Sinhalese Society, 1750-1900*. University of California Press.

Peebles, Patrick, 1995. *Social Change in Nineteenth Century Ceylon*. Navrang

Roberts, Michael, 1973. 'Elite Formation and Elites', *History of Ceylon Vol.* 3, ed. K. M. de Silva. University of Ceylon.

Roberts, Michael, 1995. *Caste Conflict and Elite Formation*. Navrang.

Ryan, Bryce, 2004. *Caste in Modern Ceylon*. Navrang.

Sharma, Ursula, 2005. *Caste*. Viva Books.

Srinivas, M.N. *The Oxford India Srinivas*, Oxford University Press.

Uyangoda, J., 2000. 'The Inner Courtyard: Political Discourse of Caste, Justice and Equality in Sri Lanka'. *Pravada* vol. 6, 9 & 10.

කන්නන්ගර පී. ඩී., 1965. **ලංකාවේ යුරෝපීය යටත් විජිත පාලනය (18-7-1965 දින පවත්වන ලද සාකච්ඡා සම්මේලනයේ සටහන්)**. විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ ඉතිහාස සමිතිය.

ද සිල්වා, එම්. යූ., 2019. **අමරපුර නිකායේ ආරම්භය හා විකාශය**. ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාව.

පීරිස්, රැල්ෆ්, 2001. **සිංහල සමාජ සංවිධානය - මහනුවර යුගය**. විසිදුනු ප්‍රකාශකයෝ.